දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
தொடர் தொலைக் கல்வி நிலையம் - பேராதனைப் பல்கலைக்கழகம்
CENTRE FOR DISTANCE & CONTINUING EDUCATION – UNIVERSITY OF PERADENIYA

First Year (100 Level) Examination in Bachelor of Arts (External New Syllabus)
(April 2017)

# ECNE 101: ආර්ථික විද්‍යාව හැඳින්වීම (Introduction to Economics)

*උපදෙස්*

ඕනෑම ප්‍රශ්ණ **හතරකට** පමණක් පිළිතුරු සපයන්න

කාලයඃ **පැය තුනයි**

සෑම ප්‍රශ්නයකටම ලකුණු 25 ක් හිමි වේ

---

1. i. "නොමිලයේ ලැබෙන දිවා ආහාර වේලක් ලෙස කිසිදු දෙයක් නොමැත" යන ප්‍රකාශය සම්පත් හිඟතාවයට අදාලව පැහැදිලි කරන්න
   ii. "ප්‍රාග්ධන භාණ්ඩ සඳහා ආයෝජන කිරීම සහ පාරිභෝජන භාණ්ඩ නිෂ්පාදනය කිරීම අතර අද දිනයේදී තේරීම් සිදුකිරීම කිසියම් ආර්ථිකයක අනාගත නිෂ්පාදන හැකියාව තීරනය කිරීම කෙරෙහි බලපානු ඇත" ඔබ එකඟ වන්නේද? පැහැදිලි කරන්න
   iii. විවිධ ආර්ථික පද්ධතීන් නම් කරන්න. ඒවායේ ප්‍රධාන ලක්ෂණයන් හඳුනාගන්න
   iv. වෙළඳපොල ක්‍රියාවලිය තුළ හිඟ සම්පත් වෙන් කිරීම සඳහා අවශ්‍ය සංඥා (signal) සැපයීමක් මිල මඟින් සිදු කරනු ලබයි. වෙළඳපොල සංඥා (signal) සැපයීමේ ක්‍රියාවලියේදී මිලෙහි කාර්යයභාරයන් පැහැදිලි කරන්න

2. i. ඉල්ලුම් න්‍යාය (theory of demand) හා ඉල්ලුම් නීතිය ( law of demand) අතර වෙනස කුමක්ද?
   ii. කිසියම් භාණ්ඩයක මිල හා එහි ඉල්ලුම් ප්‍රමාණය අතර ධන සම්බන්ධතාවක් පැවතිය හැකි අවස්ථාවන් මොනවාද?
   iii. පහත සඳහන් වගන්ති වලින් පැහැදිලි කරනු ලබන නිෂ්පාදන වර්ගයන් හඳුනාගන්න
   a. ආදායම් ඉල්ලුම් නම්‍යතාවයේ සංගුණකය 1ට වඩා අඩු භාණ්ඩ
   b. ආදායම් ඉල්ලුම් නම්‍යතාවයේ සංගුණකය 1ට වඩා වැඩි භාණ්ඩ
   c. හරස් ඉල්ලුම් නම්‍යතා සංගුණකය ධන අගයක් ගනු ලබන භාණ්ඩ
   d. හරස් ඉල්ලුම් නම්‍යතා සංගුණකය ඍන අගයක් ගනු ලබන භාණ්ඩ

   iv. කිසියම් භාණ්ඩයක වෙළඳපොළ ඉල්ලම් හා සැපයම් දැක්වෙන සමීකරණයන් පහත ලෙස දක්වා ඇත

   $$Q_d = 600 - 10P$$
   $$Q_s = 10P$$

   රජය මිල සහන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්නේ යැයි උපකල්පනය කරන්න. ඒ අනුව ඒකකයක මිල රු. 50 ක් ලෙස වූ සහතික මිලක් යටතේ අතිරික්ත නිමවුම රජය මිලදී ගනු ලබයි. පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

   a. රූප සටහනක ඉල්ලුම් හා සැපයුම් වක්‍රයන් නිර්මාණය කරන්න
   b. රජය මැදිහත් නොවන තත්ත්වයකදී සමතුලිත මිල හා ප්‍රමාණය ගනනය කරන්න
   c. රජය සහතික මිල යටතේ අතිරික්ත භාණ්ඩ ප්‍රමාණය මිලදී ගන්නා අවස්ථාවකදී පාරිභෝගික පැහැදම සහ නිෂ්පාදකයාගේ ආදායම ගනනය කරන්න
   d. සහතික මිල නිසා පාරිභෝගික අතිරික්තයෙහි හා නිෂ්පාදන අතිරික්තයෙහි ඇති වන වෙනස ගනනය කරන්න

3. i. පහත සඳහන් සංකල්පයන් අතර වෙනස පැහැදිලි කරන්න
   a. ආර්ථික ලාභ හා ප්‍රමාණික ලාභ (economic profit and normal profits)
   b. ප්‍රත්‍යක්ෂක පිරිවැය හා ආරෝපිත පිරිවැය (explicit costs and implicit costs)
   c. සාමාන්‍ය ඵලදාව හා ආන්තික ඵලදාව (AP and MP)
   d. යෙදවුමක ඵලදාව හා පරිමාණානුකුල ඵල (returns to an input and returns to scale)

ii. එකම රූප සටහනක සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රය, සාමාන්‍ය ස්ථාවර පිරිවැය වක්‍රය, සාමාන්‍ය පිරිවැය වක්‍රය හා ආන්තික පිරිවැය වක්‍රයන් අඳින්න

iii. AC වක්‍රය අවම වන ලක්ෂයට වමින් පිහිටි ලක්ෂයකදී ආන්තික පිරිවැය වක්‍රය අවම වන්නේ ඇයිද යන්න පැහැදිලි කරන්න

iv. වැඩිවන, අඩුවන හා ස්ථාවර පරිමාණානුකුල ඵල අර්ථ දක්වන්න

v. දිගුකාලයේදී සියලු පිරිවැය විචල්‍ය පිරිවැය වේ. පැහැදිලි කරන්න

vi. වෙලඳපළක තරඟකාරීත්වය තීරණය කරනු ලබන සාධක මොනවාද?

4. i. සාර්ව ආර්ථික අරමුණු හඳුනාගන්න

ii. මූර්ත GDP හා නාමික GDP අතර වෙනස පැහැදිලි කරන්න

iii. ජීවන තත්ත්වය මැනීම සඳහා මූර්ත ඒක පුද්ගල ආදායම හොඳ මිනුම් දඬුවක් නොවන්නේ ඇයිද යන්නට හේතු දෙකක් පැහැදිලි කරන්න

iv. පහත සඳහන් සංකල්පයන් අතර වෙනස හඳුනාගන්න
   a. GDP and GNP
   b. පෞද්ගලික ආදායම හා වැයකල හැකි ආදායම (personal income and disposable income)
   c. ශුද්ධ අපනයන හා විදේශ ශුද්ධ සාධක ආදායම (net export and net foreign factor income)
   d. රජයේ මුලු බදු ආදායම හා ශුද්ධ වක්‍ර බදු ආදායම

v. ලංකාවේ ජාතික ගිණුම්කරණ පද්ධතිය තුල මෑත කාලයේදී සිදු කරන ලද වෙනස්කම් පැහැදිලි කරන්න

5. i. පහත සඳහන් තොරතුරු මඟින් පැහැදිලි කරනු ලබන ආර්ථිකයක් පිළිබඳව සලකා බලන්න

| | |
|---|---|
| පාරිභෝජන ශ්‍රිතය | $C = 100 + 0.75\,Y^d$ |
| ආයෝජනය | $I = 75$ |
| බදු අනුපාතය | $t = 10\,\%$ |
| සංක්‍රාම | $TR = 100$ |
| රජයේ වියදම | $G = 100$ |

   a. MPC, APC, MPS සහ APS අර්ථ දක්වන්න
   b. සමතුලිත ආදායම් මට්ටම ගනනය කරන්න
   c. ගුණකයේ අගය ගනනය කොට එය අර්ථ දක්වන්න
   d. රාජ්‍ය අයවැය හිඟය ගනනය කරන්න
   f. රූප සටහනක සමතුලිත ආදායම් මට්ටම නිර්මාණය කරන්න

ii. මුදල් සැපයුමේ වැඩි කිරීමක් උද්ධමනකාරි වන්නේ කුමන තත්ත්වයක් යටතේද යන්න පැහැදිලි කරන්න

6. පහත සඳහන් ඒවායෙන් ඕනෑම **පහක්** පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න

i. මූලික ආර්ථික ප්‍රශ්න (basic economic problems)
ii. පූර්ණ තරගකාරී වෙළඳපලක ලක්ෂණයන් (characteristics of perfect competitive market)
iii. ආදේශන හා අනුපූරක භාණ්ඩ (substitutes and complementary goods)
iv. මූල්‍ය හා පිස්කල් ප්‍රතිපත්තීන් (fiscal and monetary policies)
v. වෙළඳපල අසමර්ථතා (market failure)
vi. මුදලෙහි කාර්යයන් (functions of money)
vii. නිවාස ඉල්ලුම් තීරනය කරනු ලබන සාධක (determinants of housing demand)